# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2345/55 – 2023 අගෝස්තු මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 146 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/15/2020/VE/112.

ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මතු/ඉ/අ/ 4/1583.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 02 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, මතුගම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 806ජී, ඉද්දගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉද්දගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KA/MAT/2022/233 හා 2023.01.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර A - වෝගන් වත්ත (ඉහළ කොටස) - ප්‍රමාණය: හෙක්. 0.6246**

උතුරට: කොටගල වැවිලි සමාගම හිමිකම් කියන වෝගන් වතුයාය (ඉහළ කොටස) සහ මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය සහ කොටගල වැවිලි සමාගම හිමිකම් කියන වෝගන් වතුයාය (ඉහළ කොටස)

EOG 08- 0178



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 147 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/3/2022/VE/90.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BD/WM/LND/AQUIS/41.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 අගෝස්තු මස 02 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී. –** ප්‍රාදේශීය ලේකම්, වැලිමඩ.

2. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, මාලිගාතැන්න 62- ජී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හොරදොරොව්ව (කොටසක්) (අ.ග.පි. 462A)ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/WLM/2022/657 හා 2023.04.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර A -බෝව්වත්ත වතුයාය - ප්‍රමාණය: හෙක්. 1.7159**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: බෝව්වත්ත වතුයායේ ක්ෂේත්‍ර අංක 18;

EOG 08- 0179